2022 වර්ෂයේදී ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන කාර්යාලය මඟින්, අනෙකුත් කාර්යාල මඟින් හා පුහුණු මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා භාණ්ඩ හා සේවා සපයමින් කටයුතු කර ඇත.

5.3. ප්‍රවාහන කටයුතු

ජාතික තරුණ සේවා සභාවේ අරමුණු හා පරමාර්ථ ඉටු කිරීම සඳහා විවිධ අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වලදී ප්‍රධානතම සහාය සේවාවක් වශයෙන් ප්‍රවාහන සේවා සැපයීම මෙමඟින් සිදු වේ

5.4. අභ්‍යන්තර විගණක කටයුතු

ජාතික තරුණ සේවා සභාවට අදාළව විගණකාධිපති විසින් අනුමත කර ඇති විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සභාපතිතුමාගේ උපදෙස් මත කෙරෙන විමර්ශන හා වෙනත් විශේෂ රාජකාරී ඉටුකිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

5.5. ලේකම් කාර්යාලය හා සම්බන්ධ කටයුතු

ලේකම් අංශය මඟින් ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම, පවත්වාගෙන යාම, එහිදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අංශ සහ අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වෙත බෙදා දීම සිදු කරනු ලබයි. ඊට අමතරව ජාතික තරුණ සේවා සභාවේ වෙනත් වැඩසටහන් වලට අදාලව අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරී කටයුතු ද ඉටු කරනු ලැබේ.

5.6. නීති විමර්ශන ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාව විසින් පවරා ඇති නඩු සම්බන්ධව හා මෙම සභාවට එරෙහිව පවරා ඇති නඩු පිළිබඳව මෙම සභාව වෙනුවෙන් හා/හෝ සභාපති අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට පෙනී සිටීම හා කරුණු ඉදිරිපත් කිරීම ද , අවශ්‍යතාවය අනුව නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීම ආදි කටයුතු නීති විමර්ශන අංශය මඟින් සිදුකෙරේ.

5.7. ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරකම්.

ඉදිකිරීම් / නඩත්තු අංශය මඟින්, දිවයින පුරා පවතින සියළුම පළාත් කාර්යාල , දිස්ත්‍රික් කාර්යාල හා තරුණ මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා වෘත්තීය පුහුණුවට අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණ කටයුතු ඉටු කරනු ලබයි. ඊට අමතරව මහරගම ප්‍රධාන කාර්යාලයේ පල්දොරු පද්ධතියේ නඩත්තු කටයුතු කිරීම, ප්‍රධාන රංග ශාලාවේ දෛනික නඩත්තු කටයුතු කිරීම, උද්‍යාන අලංකරණ කටයුතු ඉටුකිරීම හා තරුණ මධ්‍යස්ථාන දෛනික නඩත්තු කටයුතු හා අළුත්වැඩියා කටයුතු ඉටු කරනු ලබයි.

<u>2022 වර්ෂයට අදාල ව්‍යාපෘතින්වල ප්‍රගතිය</u>

2022 වර්ෂය සඳහා කාර්තු වශයෙන් ප්‍රතිපාදන වෙන් වූ අතර පසුගිය වසර වල සිට ඉටුවෙමින් පැවති පහත ඉදිකිරීම් හා නවීකරණ ව්‍යාපෘති සාර්ථකව අවසන් කර භාවිතයට ගනිමින් පවතී.

1. පොල්ගොල්ල පුහුණු ගොඩනැගිල්ල ඉදිකිරීම
2. මහරගම තරුණ මධ්‍යස්ථානය ගබඩාව හා රියදුරු නේවාසිකාගාරය ඉදිකිරීම.
3. පිහිනුම් තටාකය ඉදිකිරීම - මහරගම තරුණ මධ්‍යස්ථානය

මීට අමතරව පහත ව්‍යාපෘතීන් මේ වනවිට ක්‍රියාත්මක මට්ටමේ පවතී.

1. හලාවත පුහුණු මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම අවසන් අදියර
2. බෙල්වුඩ් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය - අදියර 1
3. බෙල්වුඩ් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය - අදියර 11
4. නුවරඑළිය සංචාරක බංගලාව ඉදිකිරීම

5.8. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා 2022 වසර තුල දරන ලද ප්‍රයත්නයන්

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම සහ සෑම වයස් කණ්ඩායමක් සඳහාම, ශරීර සුවතාව වර්ධනය කිරීම	2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මගින් හා වලක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	ක්‍රීඩා වැඩසටහන් සඳහා සහභාගි වූ සහභාගිකයින්			√
පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සෑමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම	2030 වන සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුලුවල අදාල කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහල නැංවීම	2022 වසරේ වෘත්තිය, ව්‍යවසායකත්ව පුහුණු ලබා ගත් තරුණ තරුණියන් සංඛ්‍යාව		√	

5.9. 2022 වර්ෂය තුළ ලබාගත් විශේෂ ජයග්‍රහණ (ඡායාරූප සමඟ)


- ජාතික අවශ්‍යතාවයන්ට උර දීම උදෙසා තරුණතරුණියන් නවීන තාක්ෂණය ඔස්සේ කෘෂි වගාවන් සඳහා වැඩි නැඹුරුවක් ඇති කිරීම. තවද පවත්නා ගොවිපල සඳහා නවීන තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම.





උදා - කන්තලේ ගොවිපල මධ්‍යස්ථානය තුළ බිංදු ජල සම්පාදන (Drip Irrigation) ක්‍රමවේදය යටතේ නවීන තාක්ෂණයෙන් යුත් වගාවන් , බිම්මල් වගාවන්...)

- මාර්ගස්ථ ක්‍රමයෙන් (Online) රාජකාරී ඉටු කර ගැනීම සඳහා මෘදුකාංග නිර්මාණය කිරීම.



- ජාතික වශයෙන් ඇති වූ ඉන්ධන අර්බුධකාරී තත්වයේදී QR Code හා ලියාපදිංචි කටයුතු සඳහා තරුණයන් හා නිළධාරීන්ගේ දායකත්වය ලබ දෙමින් ජාතික ප්‍රශ්නයකට විසඳුම් ලබා ගැනීමට පහසුකම් සැලසීම.



- බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් තරුණයන්ට නායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.







- රැකියා ඉලක්කගත පුහුණු සඳහා තරුණයන්ගේ වැඩි දායකත්වයක් ලැබීම



- ජාත්‍යන්තර තරුණ දින මුල්කර ගනිමින් වැඩසටහන් රැසක් තරුණ තරුණියන් ස්වේච්ඡා මැදිහත්වීමෙන් ක්‍රියාත්මක කිරීම.



- අඩු ආදායම්ලාභී තරුණ තරුණියන් 1600ක් සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ එක්ව ජපන් භාෂා කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රටේ පැවැති විවිධ අර්බුධකාරී තත්වයන් හමුවේ ද සෞන්දර්ය නිකේතනයන් වල (බෙල්වුඩ්, මහරගම, එරමිණියාය) සිසුන් 221ක් අධ්‍යාපනය ලැබීම හා මේ වන විට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ප්‍රසංග සඳහා ජාතික තරුණ සේවා සභාවේ විශේෂ නර්තන හා සංගීත කණ්ඩායම් වල සහය ලබා දීම.



- ක්‍රීඩා සමාජයට තරුණ තරුණියන් 1155 ප්‍රමාණයක් සම්බන්ධ වීම.

- රටේ පවත්නා මූල්‍ය අර්බුධකාරී තත්ත්වය හමුවේ තරුණ තරුණියන් ස්වේච්ඡාවෙන් දිවයින පුරා සෑම දිස්ත්‍රික්කයකම ස්වේච්ඡා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.







6. කාර්ය සාධන වාර්තාව 2022

6.1. ආයතනයේ කාර්ය සාධනය

1. ප්‍රතිපාදන සැලසීම

2022 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ සමස්ත ලැබීම් වලින් රු. මි.**1,256,884** ක් මහා භාණ්ඩාගාරයෙන් ද අමාත්‍යාංශය හා බාහිර ආයතන හා විදේශ සංවිධාන හරහා රු.මි.**104,767.3** ක් ද ලැබී ඇත. එයින් රු. මි. **1239** ක් පුනරාවර්ථන වියදම් වශයෙන් හා රු.මි. **488** ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැයකර ඇත. එම වසරේ ජාතික තරුණ සේවා සභාව සිය අභ්‍යන්තර ආදායම් මාර්ග වලින් **රු. මී.230,558.53** ක් උපයාගෙන තිබේ.

2. සංවර්ධන වැඩසටහන්

ජාතික තරුණ සේවා සභාව 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් යටතේ තරුණ කුසලතා සංවර්ධනය සඳහා වූ දේශීය වැඩසටහන් **12,184** ක් **344,3220** ක තරුණ පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වා ඇත. ඒ සඳහා වැයකර ඇති මුදල රු. මි. **62.42** කි. 2022 දී පැවැත්වූ තරුණ ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම් අතර, සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් තුලින් සෞන්දර්ය නිකේතන 03හි අභ්‍යාසලාභීන් 188 දෙනෙකු පාඨමාලා හදාර ඇති අතර, නාට්‍ය හා රංග කලා පාඨමාලාව සඳහා අභ්‍යාසලාභීන් 35 දෙනෙකු සහභාගි වී ඇත. විශ්ෂ නර්තන කණ්ඩායම සඳහා තරුණ තරුණියන් 20 දෙනෙක්ද සංගීත කණ්ඩායම සඳහා තරුණ තරුණියන් 20 දෙනෙක්ද ඇතුලත්වී ඇත. ඊට අමතරව ජාතික සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද ජාතික තරුණ සේවා සභාව කටයුතු කර ඇත. තරුණ සංවර්ධන වැඩසටහන් යටතේ යෞවන සමාජ සාමාජිකත්වය ලද තරුණ තරුණියන් සංඛ්‍යාව 266,601කි.

ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරම් යටතේ හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගනිමින් වොලිබෝල් හා කබඩි ක්‍රීඩා සංචිතය පවත්වන ලදි. එහිදී වොලිබෝල් සංචිතය සඳහා පුහුණුව ලැබීමට 27 දෙනෙකු හා කබඩි (පිරිමි) සංචිතය සඳහා 14 දෙනෙකුද සහභාගි වී ඇත. මීට අමතරව බාහිර ප්‍රතිපාදන ලැබීම් මඟින් **“ලොව දිනන අපි නායකත්ව පුහුණු වැඩසටහන”** යටතේ පළාත් මට්ටමේ ක්‍රීඩා පුහුණු කඳවුරු 09ක් ද යෞවන සමාජ ව්‍යාපාරය හා සම්බන්ධ තරුණ නායක නායිකාවන් සඳහා පැවැත්වූ ක්‍රීඩා හා නායකත්ව පුහුණු කඳවුර , ජපන් ශ්‍රී ලංකා ක්‍රීඩා හා සංස්කෘතික සහයෝගිතා වැඩසටහන හා තරුණ කටයුතු ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු වල නියලෙන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව 3,132කි. මීට අමතරව තරුණ සේවා ක්‍රීඩා සමාජ වැඩසටහන යටතේ ක්‍රීඩා ඉසව් 17ක් සඳහා පුහුණුවීම් කටයුතු සිදු කර ඇති අතර එහි තරුණ සහභාගිත්වය 1155කි.

පස්වන ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුව ක්‍රියාත්මක කිරීම හා එහිදී දෙවන සැසිවාරය සඳහා මාලදිවයින ජනරජයේ ගරු කථානායක මොහමඩ් නෂීඩ් මැතිතුමා සහභාගි වීම සුවිශේෂී අවස්ථාවක් ලෙස දැක්විය හැක. කෘෂි ව්‍යවසායකයින් තෝරා ගැනීම සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම මෙම වසරේදී සිදු කරන ලදි.

3. කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම්

- කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් යටතේ ජාතික තරුණ සේවා සභාව පුහුණු මධ්‍යස්ථාන 56කදී පැවැත්වූ පූර්ණකාලීන හා අර්ධකාලීන පුහුණු පාඨමාලා 108 ක් සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව 18,315 ක් වන අතර, වර්ෂය අවසන් වන විට සිසුන් 15,683 දෙනෙකු පාඨමාලා සම්පූර්ණ කර ඇත. ඒ අතරින් සිසුන් 8,229 ක් NVQ මට්ටමේ පාඨමාලා අවසන් කර ඇත. 2022 ඔක්තෝම්බර් මස අභ්‍යාසලාභීන් 28 දෙනෙකුගේ සහභාගිත්වයෙන් රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5) 2022 සැප්තැම්බර් ආරම්භ කර පවත්වා ගෙන යනු ලැබේ. එය 2023 සැප්තැම්බර් අවසන් වීමට නියමිතව ඇත.

4. ව්‍යවසායකත්ව හා කෘෂි සංවර්ධනය

තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සඳහා තරුණයින් 9000ක් ලියාපදිංචි කිරීම. ගොවිපොළ මධ්‍යස්ථාන 21ක් සංවර්ධනය කර නඩත්තු කිරීම , මහරගම ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කොට ගනිමින් වෙළඳ කුටි 15 සහිතව ගොවිපල නිෂ්පාදන අලෙවි පොල පැවැත්වීම. එහි මුළු ආදායම රු.1,755,993/-ක් වූ අතර , ශුද්ධ ලාභය රු.981,744/- විය. තරුණ කෘෂි සමාගම් ලියාපදිංචි කිරීම ආරම්භ කිරීම මෙම වසර තුලදී සිදු කරන ලදි.

5. ජාත්‍යන්තර තරුණ සබඳතා

ට්‍රිනිඩෑඩ් ටුබැගෝ හි පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය දෙවන තරුණ පාර්ලිමේන්තුව නියෝජනය කිරීම සඳහා තරුණ තරුණියන් 02 සහභාගිවීම, තරුණ තරුණියන් 800 සහභාගිත්වයෙන් 70 වන ජපන් මිත්‍රත්ව වැඩසටහන පැවැත්වීම 2022.01.26 දින එබින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ ප්‍රදානෝත්සවය 2019/2020/2021 වර්ෂ සඳහා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේදී පවත් වන ලද අතර එහිදී ලෝකඩ, රජත හා ස්වරණ තිළිණ සම්මාන ලබා ගත් තරුණ තරුණියන් සංඛ්‍යාව 450කි.

6. කාර්ය මණ්ඩල කටයුතු හා සංවර්ධනය

වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 36 දෙනෙකු සඳහා අභ්‍යන්තර උසස්වීම් ලබා දීම සිදු විය. නිලධාරීන් 104 ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 03 ක් පැවැත්වීමට කටයුතු කර ඇත. කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) නිර්මාණය කොට පවත්වා ගෙන යම.

7. ඉදිකිරීම් කටයුතු

පසුගිය වසර වල සිට ඉදිකෙරෙමින් පැවති පොල්ගොල්ල පුහුණු ගොඩනැගිල්ල ඉදිකිරීම, මහරගම තරුණ මධ්‍යස්ථානය ගබඩාව හා රියදුරු නේවාසිකාගාරය ඉදිකිරීම හා මහරගම තරුණ මධ්‍යස්ථානයේ පිහිනුම් තටාකය ඉදිකිරීම හා නවීකරණ ව්‍යාපෘති සාර්ථකව අවසන් කර භාවිතයට ගනිමින් පවතී.

6.2. කෙටිකාලීන හා මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග

කෙටිකාලීන ක්‍රියාමාර්ග

- කාලීන තරුණ අවශ්‍යතා හඳුනා ගැනීම.
- තරුණ තරුණියන්ගේ කායික හා මානසික සෞඛ්‍ය ගොඩ නැංවීම සඳහා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දේශීය හා විදේශීය වෙළෙඳ පොළ ඉලක්ක කරගත් පාඨමාලා හඳුන්වාදීම.
- පුහුණු පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- විදේශ රැකියා අවස්ථා මත ජාත්‍යන්තර භාෂා පාඨමාලා වැඩි කිරීම
- දැනුම සහ පහසුකම් ලබාදෙමින් තරුණ ව්‍යවසායකයින් බිහිකිරීම.
- දේශීය හා විදේශීය තරුණ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- තීරණ ගැනීමේ ක්‍රියාවලියට තරුණ තරුණියන්ට පහසුකම් හා අවස්ථා ලබා දීම.

මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග

- ආයතනික දැක්ම, අරමුණු හා පරමාර්ථ අනුව උපාය මාර්ගික ක්‍රම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ආයතනයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සහ තරුණ සංවර්ධන කටයුතු සඳහා සමාජ ආකර්ෂණය වැඩි කිරීම.
- කෘෂිකාර්මික ආර්ථිකයකට සහ කෘෂි ව්‍යවසායකත්වයකට තරුණයන් යොමු කිරීම.
- විදේශ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සමඟ සහයෝගීතාවයෙන් තරුණයින් සඳහා ඇති විදේශීය වෙළඳපල අවස්ථා ලබා ගැනීම.
- කාර්යමණ්ඩල කාර්යක්ෂමතාවය උදෙසා ඇගයීම්, පුහුණු ලබා දීම තුළින් මානසික අසමතුලිතතාවය හා අවිනිශ්චිතභාවයන් අවම කිරීම හා නිලධාරින් අභිප්‍රේරණය කිරීම.
- කාලීන අවශ්‍යතා අනුව, තාක්ෂණික ක්‍රමවේද ආයතනය තුළ නිර්මාණය කිරීම.

7. 2022 වර්ෂයට අදාල විගණන විමසුම් මඟින් දක්වා ඇති කරුණු නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

විගණන විමසුම් අංකය	විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු	නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග
SYA/B/NYSC/2021/AQ12/	Sri Lanka Youth Start-Up Challenge වැඩ සටහන පිළිබඳ පරීක්ෂාව	Sri Lanka Youth Start-Up Challenge වැඩ සටහනේ මූලික අරමුණ වූයේ තරුණ ව්‍යවසායකයින් බිහිකිරීමයි. මෙහිදී තරුණ ව්‍යවසායකයින් දිරිගැන්වීම අරමුණු කරගනිමින් කුඩා පරිමාණයේ ව්‍යාපාර ආරම්භ කර ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා තම ව්‍යාපාර දියුණු කරගත් ජයග්‍රාහී පුද්ගලයන් බිහිකරන කෙටි වීඩියෝ පටයක් සකස් කරන ලදි. විශේෂ ව්‍යාපෘති හා කෘෂි සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කර තිබූ සාරභූමි තරුණ ගොවිපල නිෂ්පාදන හා අලෙවි ප්‍රදර්ශන වැඩසටහන 2021 අප්‍රේල් 04 සිට 06 දක්වා පවත්වන ලද අතර, පහත අරමුණු ඉටුකර ගැනීම මෙහි පරමාර්ථය විය. • තරුණ තරුණියන් තුල කෘෂිකාර්මික කටයුතු පිළිබඳ උනන්දුවක් ඇතිකිරීම • නවීන තාක්ෂණික කෘෂි කාර්මික ක්‍රම පිළිබඳ තරුණ තරුණියන් දැනුවත් කිරීම • තරුණ ගොවි නිෂ්පාදන ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් දිරිගැන්වීම • තරුණ තරුණියන්ගේ ආකල්පයම වෙනසක් ඇති කර කෘෂි කාර්මික ක්ෂේත්‍රය කෙරේ වැඩි නැඹුරුවක් ඇතිකිරීම
SYA/B/NYSC/2021/AQ/13	2021වර්ෂයේ පුහුණු අභ්‍යාසලාභීන් වෙත නිළ ටී ෂර්ට් මිලදී ගැනීම් පරීක්ෂාව	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කාර්යයන් සඳහා මිල ගණන් කැඳවීමේදී පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල , ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආශ්‍රිත සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සිදුකරනු ලබන අතර, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. ඉදිරි ප්‍රසම්පාදන කාර්යයන්හිදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 - 3.4.4. යටතේ කටයුතු කිරීමට වගබලා ගන්නා ලෙසත්, ප්‍රසම්පාදන කාර්යන්හිදී අදාල පිරිවිතරයන් නිසිපරිදි ඇතුලත් කිරීමට පියවර ගන්නා ලෙසත්, රාජකාරී වගකීමෙන් නිවැරදිව ඉටුකරන ලෙසටත් අදාල නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

විගණන විමසුම් අංකය	විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු	නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග
		ඉදිරියේදී ප්‍රසම්පාදන කාර්යයන්හිදි එක් එක් ප්‍රසම්පාදනයන් සඳහා වෙන් වෙන් වූ ගොනු විධිමත් පරිදි නඩත්තු කරන ලෙසත් උපදෙස් ලබා දී ඇත. සියළුම පුහුණු මධ්‍යස්ථානයන් හි අභ්‍යාසලාභීන්ගෙන් ටී ෂර්ට් සඳහා මුදල් අයකරන්නේ නම් අයකරනු ලබන ගාස්තුව කොපමණද යන්නත් එක් එක් පුහුණු මධ්‍යස්ථාන මගින් රැස්කර ගැනීමට අපේක්ෂා කරන ටී ෂර්ට් ආදායම කොපමණද යන්නත් වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී ඇතුලත් කරන ලෙසත් ඒ සඳහා ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය ලබාගත යුතු බවටත් නිළධාරීන් දැනුවත් කර ඇත.
SYA/B/NYSC/2021/AQ/14	හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයේ ගබඩා පරීක්ෂාව	ජාතික තරුණ සේවා සභාවේ වෘත්තීය/සංස්කෘතික පුහුණු කටයුතු සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා නොතිබීමෙන් ඇතිවී ඇති දුෂ්කරතාවයන් හා පුහුණු ධාරිතාවේ ඌනතාවයන් සැලකිල්ලට ගෙන එය වඩාත් ඵලදායි හා කාර්යක්ෂම ලෙස සිදුකිරීමට අවශ්‍ය අවශ්‍යතාවය හඳුනාගෙන භාණ්ඩ/ උපකරණ මිලදී ගන්නා ලදි. ඉන්පසුව උත්සන්න වූ කොරෝනා තත්ත්වය හමුවේ රටේ පැවති සංචරණ සීමා හා සෞඛ්‍ය ආරක්ෂිත පියවරයන් හේතුවෙන් නිසිවේලාවට නිකුත්කිරීමට හැකියාව නොතිබුනි. මහරගම ප්‍රධාන ගබඩාව මේ අවස්ථාව වන විට තාවකාලික ස්ථානයක පවත්වාගෙන ගිය අතර, ගබඩා කිරීමට ප්‍රමාණවත් ඉඩකඩක් නොමැති බැවින් මෙම උපකරණ සුරක්ෂිතව තබා ගැනීමට ප්‍රධාන කාර්යාලයට ආසන්නතම සුදුසුම ස්ථානය හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය බැවින් එම උපකරණ එහි ගබඩා කළ අතර, මේ වන විට මහරගම ප්‍රධාන කාර්යාලයේ නව ගබඩාවෙ ගබඩා කිරීමට පියවර ගෙන ඇත. මෙම උපකරණ 2022.04.30 දිනට පෙර ක්ෂේත්‍රයට නිකුත් කර අවසන් කිරීමට අපේක්ෂිතය.

විගණන විමසුම් අංකය	විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු	නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග
SYA/B/NYSC/2021/AQ/15	මූල්‍ය ප්‍රකාශන විගණනය 2021 -	සී/ස තරුණ සේවා සමාගමේ මූල්‍ය වර්ෂය ද ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා සංශෝධනය කිරීමට හැකියාව පවතීද යන්න විමසා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවට හා ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කෙරේ. විෂය භාර නිළධාරීන් සමඟ සාකච්ඡා කර 2022 වර්ෂයේ සිට විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හා උපදෙස් මාලාවක් හඳුන්වා දීමට පියවර ගැනේ. සියළුම අධ්‍යක්ෂවරුන් හා මූල්‍ය නිළධාරීන් සඳහා අවසාන ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වා දැනුවත් කිරීමට කටයුතු කෙරේ. ගිණුම්කරණ පරිගනක පද්ධතිය යාවත්කාලීන කිරීම හා අවසාන ගිණුම් සකස්කිරීමට අවශ්‍ය ගනුදෙනු පිළිබඳ විස්තර නිසිවේලාවට ප්‍රධාන කාර්යාලය දැනුවත් කිරීමට පියවර නොගන්නා නිළධාරීන්ගෙන් අයකර ගැනීමට පියවර ගැනේ. විගණන පරීක්ෂාවේ දී පෙන්වා දී ඇති නිවැරදි කිරීම් 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ජර්නල් සටහන් යොදා නිවැරදි කර ඇත. තක්සේරු වාර්තා ලැබීමෙන් පසු ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කිරීමට පියවර ගැනීම හා විධිමත් පරිදි තක්සේරුකරුවන් ලවා තක්සේරු වාර්තා ලබාගෙන ජංගම නොවන වත්කම් වල දළ ධාරණ අගය ගිණුම්වල ඇතුළත් කිරීමට පියවර ගැනේ. ඇඹිලිපිටිය පුහුණු මධ්‍යස්ථානය හා ගොඩගම පුහුණු මධ්‍යස්ථානය සඳහා ජර්නල් සටහන් යොදා ඇත. ඔරුබැඳිවැව පුහුණු මධ්‍යස්ථානය ට අදාල ප්‍රත්‍යාගණන ලාභය පශු සම්පත් නිවැරදිව තක්සේරු කර තොගයට ඇතුලත් කිරීමට පියවර ගැනේ. ගිණුම්කරන දෝෂ ඇති නොවීමට වග බලා ගන්නා අතර අදාල නිලධාරීන් විෂයානුබද්ධව දැනුවත් කර ඇත. සභාව සම්බන්ධ වී ඇති නඩු 26 සඳහා පිරිවැය අවම කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත.

විගණන විමසුම් අංකය	විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු	නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග
SYA/B/NYSC/2021/AQ/16	Blood 4Hope වැඩසටහන පිළිබඳ පරීක්ෂාව	රටතුල පැවති කොවිඩ් වසංගතය හමුවේ කාලීන, ජාතික අවශ්‍යතාවයක් සහිත වැඩසටහනක් වශයෙන් ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ ප්‍රධාන ව්‍යාපෘතියේ ප්‍රජා සංවර්ධන වැඩසටහනක් යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහනකි. රටතුල පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ නේවාසිකව නර්තන හා සංගීත තරුණ තරුණියන් ද සිටි බැවින් හා වසංගත තත්ත්වය හමුවේ එහි මාර්ගෝපදේශන ක්‍රමවේදයන්ට අනුව බාහිර පුද්ගලයින් ආයතන පරිශ්‍රය තුලට ඒම වැළැක්වීම සඳහා ඉදිරිපස ඩෝම් එකක් සකස් කර කුලී පදනම මත උපකරණ ලබාගෙන අදාල වැඩසටහන පවත්වන ලදි.
SYA/B/NYSC/2022/AQ/01	2021 වර්ෂයේ සංග්‍රහ වියදම් පරීක්ෂාව.	• සභාපතිතුමාගේ කාර්යාලයෙන් පිළිතුරු ලබා දී ඇත . • අධ්‍යක්ෂ(මුදල්) විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයට උපදෙස් ලබා දී ඇත.
SYA/B/NYSC/2022/AQ/02	අවිධිමත් පත්වීම් හා අවිධිමත් ලෙස සේවයෙන් මුදා හැරීම් පරීක්ෂාව.	• විගණන විමසුමේ කරුණු කිහිපයක් සඳහා 2022.07.07 දින හා ඉතිරි සියළුම කරුණු සඳහා 2022.09.02 දින රජයේ විගණන අංශයට පිළිතුරු යවා ඇත. • මෙම වෘත්තිය පුහුණු උපදේශක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් සේවය ලබා ගැනීම සඳහා සහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, සහා සංදේශ අංක 35/2022 අනුමැතිය ලැබී ඇත.
SYA/B/NYSC/2021/AQ/03	P.G 4908 කැඹ් රථය ධාවනය සහ එහි රියදුරුගේ රාජකාරි පිළිබඳ මහජන නියෝජනය පරීක්ෂාව.	• විගණන විමසුමේ කරුණු කිහිපයක් සඳහා පළමු පිළිතුර 2022.06.29 රජයේ විගණන අංශයට යොමු කර ඇත. • විගණන විමසුමේ සම්පූර්ණ අනෙක් කොටස සඳහා පිළිතුරු 2022.10.05 දින රජයේ විගණන අංශයට යවා ඇත. • සියළුම විගණන විමසුම් විමර්ශනය කර, ධාවන සටහන් පවත්වාගෙන යාම සම්බන්ධව උපදෙස් 2022.10.06 දිනැති ලිපිය මඟින් සියළුම රියදුරු මහතුන් දැනුවත් කර ඇත.

විගණන විමසුම් අංකය	විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු	නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග
SYA/B/NYSC/2022/AQ/05	හෙයියන්තුඩුව පු/මධ්‍යස්ථානයේ නිෂ්කාර්ය වත්කම් සම්බන්ධ විගණනය.	• 2022.10.05 දින රජයේ විගණන අංශයට වෙත පිළිතුරු ඉදිරිපත් කර ඇත. • වාහන වෙන්දේසිය සඳහා පත්තර දැන්වීම පළ කිරීම සඳහා සැපයීම් අංශය වෙත භාර දී ඇත. • හෙයියන්තුඩුව ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම් කටයුතු වලට අදාළව නවීකරණ කටයුතු සිදු නොකිරීම හේතුවෙන් උපදේශන අංශයේ නිර්දේශ පරිදි අදාල කොන්ත්‍රාත්කරු අසාදු ලේඛන ගත කර ඇත.
SYA/B/NYSC/2022/AQ/06	නිල වාහන සඳහා අමතර ඉන්ධන ලබා දීම පිළිබඳ පරීක්ෂාව-11	• විගණන විමසුමට 2022.12.12 දින පිළිතුරු යවා ඇත. • නිල වාහන සඳහා ලබා ගෙන ඇති ඉන්ධන ප්‍රමාණය උපරිමය ඉක්මවා ඇති අවස්ථාවලදී සහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.
SYA/B/NYSC/2022/AQ/07	පැමිණිම පිටවීම සටහන් කිරීම.	• 2022.08.15 දින රජයේ විගණන අංශයට පිළිතුරු යවා ඇත. • විවිධ ආයතනික වැඩසටහන් හා රැස්වීම් වැනි වැඩසටහන් සඳහා ද සහභාගි වීම නිලධාරීන් විසින් සිදු කරනු ලබන බැවින්, අංශ තුල පැමිණීමේ ලේඛනයක් නඩත්තු කරනු ලැබේ. එමෙන්ම ආයතන පරිශ්‍රයෙන් පිටත යන සෑම විටම බැහැර ආකෘති පත්‍ර සභාපතිතුමාගේ අනුමැතිය ඇතිව සිදු කරනු ලබන අතර, එම පිටපත් ලේඛණ ගත කෙරේ. එමෙන්ම ඒ සියල්ල යාවත්කාලීන කිරීම අධ්‍යක්ෂ(පාලන) කාර්යාලයෙන් සිදු කරනු ලැබේ.
SYA/B/NYSC/2022/AQ/08	සභාපතිතුමාගේ තුර්කි සංචාරය.	• 2022.09.02 දින රජයේ විගණන අංශයට තොරතුරු ඉදිරිපත් කර ඇත. • ඉදිරියේදී අදාල ක්‍රමවේදය නිවැරදි කර ගනිමින් කටයුතු කිරීමට අදාල අංශ දැනුවත් කර ඇත
SYA/B/NYSC/2022/AQ/09	නේවාසිකාගාරය සම්බන්ධ ලැබූ නියෝජනය පරීක්ෂණය - 2022	• විමර්ශන වාර්තාවට අනුව යුත් පරිශ්‍රයේ නේවාසිකාගාර පහසුකම් ලබා ගන්නා අය ගෙන් ගාස්තු අය කර ගැනීමට සහා සංදේශයක් සකස් කර සහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඒ සඳහා සහා සංදේශ අංක 24/2022 න් අනුමත කර ඇත. • මේ වන විට පරිශ්‍රයේ නවාතැන් ලබා ගන්නා නිලධාරීන් ගෙන් එම මුදල් අය කර ගැනීමට කටයුතු සිදු කරමින් පවති. • 2022.10.05 දින රජයේ විගණන අංශයට තොරතුරු යවා ඇත

විගණන විමසුම් අංකය	විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු	නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග
SYA/B/NYSC/2022/AQ/10	කිණිහිරමල ටෙලි නාට්‍ය නිර්මාණය පිළිබඳ පරීක්ෂණය.	• 2022.11.23 දින රජයේ විගණන අංශයට පිළිතුරු යවා ඇත. • නාට්‍යයේ කොටස් 20 සංස්කරණය කිරීමෙන් පසුව සංගීතය එක් කිරීම නිකේතනාධිපති කරුණාරත්න විජේවර්ධන මයා විසින් නොමිලයේ සිදුකිරීමට එකඟත්වය පල කර ඇත. • සංස්කරණයෙන් පසු නැරඹීමට අවස්ථාව ලබා දීම සඳහා ටෙලි නාට්‍ය අලෙවි කිරීමට කටයුතු සිදු කර ඇත.
SYA/B/NYSC/2022/AQ/11	වාහන පරිහරණය පිළිබඳ පරීක්ෂණය	• 2022.12.12 දින රජයේ විගණන අංශයට පිළිතුරු යවා ඇත. • ලියාපදිංචි අහෝසි කිරීම සඳහා ලිපිලේඛණ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත භාර දී ඒ සඳහා මුදල් ගෙවා ඇත. • අළුත්වැඩියාවට යොමු කර ඇති වාහන කිහිපයක් මේ වන විට අදාල අළුත්වැඩියාවන් නිම කර ඇත. • ඉල්ලා ඇති සියළුම තොරතුරු මේ වන විට ලබා දී ඇත. • සංචිත වාහන පරීක්ෂණයේදී ධාවන සටහන් පත්‍රයේ වාහනයේ ගමන් කරන නිලධාරියාගේ අදාල විස්තර ඉදිරිපත් කිරීමට රියදුරන් වෙත උපදෙස් ලබා දී ඇත
SYA/B/NYSC/2022/AQ/12	බටංගල පුහුණු මධ්‍යස්ථානයේ මූල්‍ය විගණනය - 2022	• විගණන විමසුමට පිළිතුරු කෙටුම්පත් කර අධ්‍යක්ෂ ජනරාල් තුමා වෙත යොමු කර ඇත.
SYA/B/NYSC/2022/AQ/13	සෞන්දර්ය කුසලතා සංවර්ධන අංශයේ විශේෂ නර්තන හා සංගීත සංදර්ශන සඳහා ගෙවීම් පරීක්ෂාව.	• රජයේ විගණන අංශයට 2022.11.23 දින පිළිතුරු යවා ඇත • සංදර්ශන සඳහා ගෙවීම් සිදු කිරීමෙන් පසුව අවශ්‍ය සේවා ලබා දීම සඳහා කටයුතු කිරීමට හා එම වාර්තාවන් ලබා දීම සඳහා අදාල උපදෙස් ලබා දී ඇත.
SYA/B/NYSC/2022/AQ/14	ජාතික තරුණ මධ්‍යස්ථාන ක්‍රීඩා සමාජය සම්බන්ධ විගනන පරීක්ෂාව.	• විගණන විමසුමට පිළිතුරු කෙටුම්පත් කර අධ්‍යක්ෂ ජනරාල් තුමා වෙත යොමු කර ඇත.

විගණන විමසුම් අංකය	විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු	නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග
SYA/B/NYSC/2022/AQ/15	ජාතික තරුණ සේවා සභාවේ සංගීත කණ්ඩායම එහි අරමුණු හා ජයගමු තුරුණු ශක්ති සංගීත කණ්ඩායම පිළිබඳ පරීක්ෂාව.	• රජයේ විගණන අංශයට 2023.01.23 .පිළිතුරු යවා ඇත • ජයගමු තුරුණු ශක්ති සංගීත කණ්ඩායමේ ශිල්පීන්ට ගෙවීම සඳහා සහා සංදේශ අංක 06/2022 මඟින් අනුමැතිය ලබා ගෙන ඇත. • අමාත්‍යාංශයේ පැවැත්වෙන උත්සව සඳහා සංගීත කණ්ඩායම සහභාගි කරවීමට අවස්ථාව ලබා දෙන ලෙස අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් මඟින් ඉල්ලීම් කර යවා ඇත.
SYA/B/NYSC/2022/AQ/16	නිලාවේලි ගොවිපලේ කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාව	• රජයේ විගණන අංශයට 2023.01.31 පිළිතුරු යවා ඇත • මේ වන විට ඉදිරියේදි ක්‍රියාත්මක කිරීමට සිදු කර ඇති පහසුකම් සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවති . • ඉදිරි ක්‍රියාකාරි සැලැස්ම සඳහා අවශ්‍ය ශක්‍යතා වාර්තාව සකස් කර ඇත. • ඉඩම ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල නාම පුවරු සවි කර ඇත .

8. ආශ්‍රිත වාර්තා / ලේඛන.

- වාර්ෂික වාර්තාව 2021, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2022, ජාතික තරුණ සේවා සභාව.
- ක්‍රියාත්මක සැලැස්ම 2022 ජාතික තරුණ සේවා සභාව.
- දිස්ත්‍රික් ප්‍රගති වාර්තා, ජාතික තරුණ සේවා සභාව.
- ප්‍රධාන කාර්යාලීය අංශ ප්‍රගති වාර්තා, ජාතික තරුණ සේවා සභාව.
- භාණ්ඩාගාර /අමාත්‍යාංශ සංවර්ධන වියදම් වාර්තාව - 2022, ජාතික තරුණ සේවා සභාව.


9. ඇමුණුම 01 - විගණක කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව 04 ක් ලෙස නිර්ණය කර ඇති අතර, 2022 වර්ෂයේ කමිටු රැස්වීම් වාර 04 පවත්වන ලදි.

අදාල රැස්වීම් පැවැත්වීමෙන් අනතුරුව ගන්නා ලද කමිටු තීරණ ඇතුලත් වාර්තාවන් සභා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියන් සඳහා ඉදිරිපත් කර ඇත. ගන්නා ලද කමිටු තීරණයන්හි සම්පින්ඩනයක් පහත දක්වා ඇත.

- රජයේ විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති අඩුපාඩු අවම කිරීම සඳහා කටයුතු කිරීම
- අභ්‍යන්තර විගණන හා විමර්ශන වාර්තා මගින් පෙන්වා දී ඇති අඩුපාඩු මග හරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ ලබාදීම
- සමස්ථ ඉඩම් හා දේපල පවරා ගැනීමේ පටිපාටිය පිළිබඳ ප්‍රගති සමාලෝචනය
- ආයතනික සේවක මණ්ඩල කටයුතු සම්බන්ධ සමාලෝචනය
- ආයතනික සංවර්ධන කටයුතු පිළිබඳ සමාලෝචනය
- වත්කම් භාරකාරත්වය හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ සමාලෝචනය
- වාර්ෂික ගිණුම් කටයුතු සම්බන්ධව
- ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත ආයතනයන්හි කටයුතු පිළිබඳ විමර්ශනයට ලක්කිරීම

10. ඇමුණුම 02 - මූල්‍ය විගණක ප්‍රකාශය



01

ජාතික තරුණ සේවා සභාව
මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය
2022-12-31 දිනට

විස්තරය	සටහන්	2022 (රු.)	2021 (රු.)
වත්කම්			
චලිත වත්කම්			
මුදල් සහ මුදල් සමාන ද	01	106,499,005	82,851,106
වාණිජ ණය ද	02	155,515,916	185,788,277
තෑගි	03	6,192,891	7,581,366
		268,207,812	276,220,749
අචලිත මූල්‍ය වත්කම්			
ආයෝජන	04	1,799,170	1,799,170
		1,799,170	1,799,170
චලිත නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	05	2,672,650,704	2,750,597,692
අතිරික්තය යන වැඩ	06	558,786,843	559,342,449
අයිති ඉඩකඩ (පදු සම්පත්)	07	5,225,485	3,888,954
		3,236,663,032	3,313,829,095
මුළු වත්කම්		3,506,670,014	3,591,849,014
බැරකම්			
චලිත බැරකම්			
ගෙවිය යුතු ද	08	191,935,339	138,355,918
කෙටි කාලීන බැරකම්	09	53,259,672	49,320,861
		245,195,011	187,676,779
චලිත නොවන බැරකම්			
කල්දාගෙන වෙන් කිරීම්	10	507,364,132	490,158,758
මුළු බැරකම්		752,559,142	677,835,537
ශුද්ධ වත්කම්		2,754,110,871	2,914,013,477
ශුද්ධ වත්කම්/ ප්‍රතිඵල			
මණ්ඩලයේ වරණ අස්ථිත්වයන්ගේ දායක වූ			
ප්‍රාග්ධනය	11	6,408,645,025	6,408,425,110
සංචිත	12	582,856,566	435,263,615
සමුච්චිත අස්විත්තය /(ඌනතාවය)		(4,237,390,719)	(3,929,675,248)
මුළු ශුද්ධ වත්කම් / ප්‍රතිඵල		2,754,110,871	2,914,013,477

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කරන ලද්දේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රතිපත්තිවලට අනුකූලවය. ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 05 සිට 08 දක්වා ද, ගිණුම්කරණ සටහන් පිටු අංක 09 සිට 11 දක්වා ද, අඩංගුවන් මෙම මූල්‍ය ප්‍රකාශනය සකස්කර ඇත

.....
ආචාර්ය තිරාන් ද සිල්වා
සභාපති අධ්‍යක්ෂ/ජනරාල්
ජාතික තරුණ සේවා සභාව


මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම සභාවේ කළමනාකරණ මණ්ඩලය විසින් දරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශනය කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත-කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

.....
එල්.ජී.වී එරන්ද ලියනගේ
සභා අධ්‍යක්ෂ
ජාතික තරුණ සේවා සභාව

ජාතික තරුණ සේවා සභාව
2022-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

විස්තරය	සටහන් අංක	2022 (රු.)	2021 (රු.)
[illegible]			
[illegible] (ප්‍රතිස්ථාපන)		1,174,969,000	1,201,441,500
[illegible] (සංවර්ධන)		76,552,109	274,427,216
		1,251,521,109	**1,475,868,716**
[illegible] (ප්‍රතිස්ථාපන)			
[illegible]		-	393,122
[illegible] රාජ්‍ය ආයතන (ප්‍රතිස්ථාපන)		44,079,548	102,120,179
[illegible]		553,107	8,464,912
[illegible]		52,266,961	4,090,571
		1,348,420,724	**1,590,937,501**
[illegible]			
[illegible]	13	25,868,551	24,628,757
[illegible]	14	174,961,341	120,840,093
[illegible]	15	33,105,435	9,894,475
[illegible]		2,750,267	934,334
[illegible]		35,000	35,000
[illegible]	16	10,725,986	6,638,224
		247,446,580	**162,970,883**
		1,595,867,304	**1,753,908,383**
[illegible]			
[illegible]			
[illegible]	17	(1,240,223,289)	(1,239,858,229)
[illegible]		(274,308,380)	(274,551,977)
[illegible]	18	(337,046,009)	(488,686,857)
		(1,851,577,679)	**(2,003,097,063)**
[illegible]		(255,710,374)	(249,188,680)
[illegible]			
[illegible]		(3,929,675,248)	(3,678,717,737)
[illegible]		(52,005,097)	(1,768,830)
[illegible]		(4,237,390,719)	(3,929,675,248)

11. ඇමුණුම් 03 - විගණකාධිපති වාර්තාව හා ජාතික තරුණ සේවා සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එස්වයිඒ/ඩි/එන්වයිඑස්සී/1/22/92 } ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 26 දින

සභාපති
ජාතික තරුණ සේවා සභාව

ජාතික තරුණ සේවා සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික තරුණ සේවා සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Poldhuwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නික්ත්වාගණනය කළ මකය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 ඡේදය ප්‍රකාරව කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් සියළුම ආදායම් හා වියදම් අයිතම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කළ යුතු වුවද, පෙර වර්ෂයට අදාල එකතුව රු. මිලියන 93 ක් වූ වියදම් සඳහා උපචිත වියදම් ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් ආරම්භක ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම් කාණ්ඩයට අයත් සියළුම දේපළ ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, 2021 වර්ෂයේදී මධ්‍යස්ථාන 05 කට අයත් රු. මිලියන 46 ක් වූ ගොඩනැගිලි සහ 2022 වර්ෂයේ දී මධ්‍යස්ථාන 03 කට අයත් රු. මිලියන 242 ක් වූ ගොඩනැගිලි 02 ක් සහ ඉඩම් 03 ක් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 14 හි 40 වන ඡේදය ප්‍රකාරව ප්‍රධාන කළමනාකරණ පිරිසගේ සමුච්චිත පාරිශ්‍රමිකය හෙළිදරව් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ සභාපති ලෙස කටයුතු කිරීම වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාවේ සභාපති වෙත ගෙවා තිබූ රු.460,000 ක්වූ දීමනා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 27 ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට සභාව විසින් භුක්ති විඳිමින් පැවති ඉඩම් 61 කට අදාළ අක්කර 234.69 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර සභාව සතු අක්කර 06 පර්චස් 57.78 ක්වූ ඉඩම් 06 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ගබඩාව හා රියදුරු නේවාසිකාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතිවලට අදාළව කොන්ත්‍රාත්කරු විසින් සමාලෝචිත වර්ෂයේ දීර්ඝ කිරීමේ පිරිවැය (Prolongation cost), මිල විචලනය සහ ප්‍රමාද ගාස්තු වශයෙන් ඉදිරිපත් කර තිබූ රු. මිලියන 7.3 ක බිල්පත් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 හි 22 ඡේදය ප්‍රකාරව ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) 2012-2019 වර්ෂවල ආරම්භ කරන ලද කෙරිගෙන යන වැඩ ගිණුමේ ඇතුලත් රු. මිලියන 520 ක්වූ ව්‍යාපෘති 10 කින් රු. මිලියන 14 ක් පිරිවැය වූ ව්‍යාපෘති 07 ක්

ප්‍රතිපාදන නොලැබීම මතද, රු. මිලියන 159 ක්වූ ව්‍යාපෘති 03 ක් නියමිත දිනට නිම නොකිරීම හේතුවෙන් සභාව විසින් අක්තිවුවා තිබුණි.

(ඇ) කෙරිගෙන යන වැඩ ගිණුමෙහි ඇතුළත් 2021 සිට 2022 අතර වර්ෂවල වැඩ නිම කර භාවිතයට ගෙන තිබුණු වැඩ නිම කල ඉදිකිරීම් ව්‍යාපෘති 02 කට අදාළ රු. මිලියන 180 ක් ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කර නොතිබුණි. එමෙන්ම ඊට අදාළ ක්ෂය රු. මිලියන 9 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ රු. මිලියන 74.7 ක්වූ ඉඩම් 12 ක හිමිකම සනාථ කර නොතිබුණි.

(ඉ) 2014 - 2018 වර්ෂවල සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු රු. මිලියන 2.8 ක්වූ දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබූ තාවකාලික ඉදිකිරීම් භෞතිකව නොපැවතුණි.

(ඊ) ගෙවිය යුතු ශේෂය තුළ සී/ස තරුණ සේවා පෞද්ගලික සමාගමට ගෙවිය යුතු එකතුව රු. මිලියන 10 ක් දක්වා තිබුණද, එම සමාගමේ ශේෂ සනාථන ලිපිය අනුව සභාවෙන් අයවිය යුතු ශේෂය ලෙස රු. මිලියන 80 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.මිලියන 70 ක නොසැසඳුණු ශේෂයක් පැවතුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සඳහා රු. මිලියන 9.8 ක් මුදලින් ගෙවා තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මිලදීගැනීම් රු. මිලියන 52.8ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් රු. මිලියන 43 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ කෙරිගෙන යන වැඩ සඳහා රු. මිලියන 8.2 ක් මුදලින් ගෙවා තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව එය රු.මිලියන 0.5 ක ලැබීමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් රු.8.7 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) 2020 සහ 2021 වර්ෂවල වැඩ නිමකර භාවිතයට ගෙන තිබූ ඉදිකිරීම් ව්‍යාපෘති දෙකකට අදාල රු. මිලියන 9 ක් වූ ගොඩනැගිලි ප්‍රාග්ධනිත කිරීමකින් තොරව පුනරාවර්තන වියදම් ලෙස එම වර්ෂවලදී කපා හැර තිබුණි.

(ග) යෞවන තිළිණ අංශයේ ජංගම ගිණුමේ රු. මිලියන 1.3 ක්වූ ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ව) 2022 වර්ෂයේ සහ ඊට පෙර වර්ෂවල ඉවත්ව ගිය නිලධාරීන් 10 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු පාරිතෝෂික දීමනා රු. මිලියන 4.4 ක් සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් ලෙස දක්වා නොතිබුණි.

(ශ) 2021 වර්ෂයේදී ඉල්ලා අස්වූ නිලධාරීන් 05 දෙනෙකු සඳහා පාරිතෝෂික රු.966,712 ක් සමාලෝචිත වර්ෂයේ වෙන්කර තිබුණු අතර, 2022 වර්ෂයේ නිලධාරීන් දෙදෙනෙකුට සේවයෙන් ඉවත් වීමෙන් පසු කාලයට සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් ඇතුළුව වැටුප් ලෙස රු. 265,231 ක් ගෙවා තිබුණි. 1999 වර්ෂයේ හා 2001 වර්ෂවලදී සේවයෙන් ඉවත්වූ නිලධාරීන් පස්දෙනෙකු සඳහා රු.1,254,644 ක්වූ පාරිතෝෂික අප්‍රමාදව ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ෂ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් බැරකම් යටතේ විදේශ සංවිධාන ලෙස දක්වා තිබූ එකතුව රු. මිලියන 4.9 ක්වූ බාහිර ආයතන 04 ක ලැබීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකිරීම හේතුවෙන් එම ගනුදෙනුවල නිවැරදිකාවය, සම්පූර්ණත්වය හා පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඩ) ලැබිය යුතු ශේෂය තුල ඇතුළත් වර්ෂ 2000 සිට 2019 වර්ෂය දක්වා කාලසීමාවට අදාළ අයකර ගෙන නොතිබූ එකතුව රු. මිලියන 1.2 ක්වූ ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ක) වසර දෙකකට වඩා පැරණි ජ. මිලියන1.8 ක්වූ ගෙවිය යුතු තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව, එකතුව රු. මිලියන16.4 ක් වූ වසර 05 කට වඩා පැරණි විවිධ ණයහිමියන්, නොගෙවූ වැටුප්, නොගෙවූ රදවා ගැනීම්, ගෙවිය යුතු තැන්පත් සහ වැටුප් තැන්පත් වල ශේෂ නිරවුල් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ජාතික තරුණ සේවා සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුවඑසේ වාර්තාවේ (අ), (ඇ) හා (ඇ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර, යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 08 වගන්තිය	සෑම මුදල් වර්ෂයක් සම්බන්ධයෙන්ම අයවැය ලේඛණයක් පිළියෙල කල යුතු වුවද , සභාව විසින් සකස් කරන ලද ලේඛණයෙහි අරමුදල් ලැබෙන මාර්ග පිළිබඳව පුරෝකථනය සිදු නොකර වියදම් පමණක් පුරෝකථනය කර තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි 156 සහ ආයතන සංග්‍රහයේ II කොටස	යම් නිළධාරියෙකුගේ ප්‍රමාදයක්, නොසැළකිල්ලක්, වරදක් හෝ වංචාවක් හේතුකොට ගෙන රජයට සිදුවන ඕනෑම පාඩුවක් සම්බන්ධයෙන් ඒ නිළධාරියා පෞද්ගලිකව වගකිව යුතු වන අතර, එමගින් සිදුවන පාඩුව පූර්ණය කළ යුතු වුවද, රු. මිලියන 10.9 ක් පිරිවැය වූ කුකුල් කෑම මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමත සීමාවන් ඉක්මවා අනුමත කිරීම හා වෙනත් ගොවිපොලවල සඳහන් මිල ගණන. නොසසඳා නොසැලකිලිමත් භාවයකින් කටයුතු කිරීම නිසා සිදු වී තිබූ දළ වශයෙන් රු. මිලියන 4.6 ක පාඩුව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(ඇ)	2018 දෙසැම්බර් 07 දිනැති අංක PS/SP/SB/21/2018 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය	සභාව සතුව නේවාසික පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු මධ්‍යස්ථානවල ප්‍රමාණවත් පහසුකම් නිබියදී, ප්‍රජා හා ධාරිතා සංවර්ධන වැඩසටහන බාහිර ආයතනයක පවත්වා නේවාසික ගාස්තු, ආහාර අත්‍යාවශ්‍ය ගාස්තු ලෙස රු. මිලියන 24.2 ක් ගෙවා තිබුණි.

(ඇ) 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP/SB/07/15 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය

උත්සව, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා අවම පිරිවැයක් යටතේ ලබාගත හැකි ආයතන පමණක් යොදා ගන්නා ලෙස දක්වා තිබුණද, ඊට අනුගත නොවී ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය නොකර ප්‍රජා හා ධාරිතා සංවර්ධන වැඩසටහන පෞද්ගලික ආයතනයක් මගින් ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කර තිබුණි.

(ඉ) 2021 දෙසැම්බර් 21 දිනැති රාජ්‍ය අයවැය චක්‍රලේඛ අංක 3/2021 හි 04.02 හි iii ඡේදය

දේශීය අරමුදල් භාවිතා කරමින් විදේශ වාරිකා සංවිධානය නොකළ යුතු අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් යම් නිල රාජ්‍යමය නිශ්චිත සහභාගීත්වයක් අත්‍යාවශ්‍ය නොවන්නේනම් දේශීය අරමුදල් මගින් වියදම් දරමින් සම්මන්ත්‍රණ/වැඩමුළු ආදිය සඳහා නිලධාරීන් සහභාගී නොකළ යුතු බව පැහැදිලිව දක්වා තිබියදී, සභාපති / අධ්‍යක්ෂ ජනරාල් හට සංයුක්ත දීමනා, අනියම් දීමනා හා ගුවන් ටිකට්පත් සඳහා රු. මිලියන 1.8 ක දේශීය අරමුදල් වැයකර තිබුණි.

(ඊ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED/12 හි 8.3.9 ඡේදය

සභාව සතු සම්පත් රේඛීය අමාත්‍යාංශය වෙත ලබා නොදිය යුතු බව දක්වා තිබියදී 2015 සහ 2021 වර්ෂවලදී සභාව සතු වාහන 02 ක් බාහිර ආයතන වෙත ලබාදී තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා තරුණ සේවා සභාවේ මූල්‍ය ප්‍රකාශන එහි සියයට 98 ක කොටස් හිමිකාරිත්වයක් සහිත පාලිත සමාගමක් වන සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ, මූල්‍ය ප්‍රකාශන සමග ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. ඒ අනුව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික

සමාගම අවසන් වරට විගණනයට ඉදිරිපත් කර තිබූ 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. මිලියන167 ක වත්කම්, රු. මිලියන 92 ක වගකීම් හා 2022 වර්ෂයේ සමාගමේ රු. මිලියන 184 ක ආදායම් හා රු.මිලියන 116 ක වියදම් සහාවේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2020 වර්ෂයේ සිට භාවිතයට නොගත් පිරිවැය රු. මිලියන1.3 ක්වූ පාරිභෝගික ද්‍රව්‍ය අයිතම 97 ක් පැවතුණි.

(ඇ) 2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දිනට සහාව විසින් වෙනත් රාජ්‍ය ආයතනවලින් ලබා ගෙන තිබූ වාහන 02 ක් විධිමත්ව පවරාදීමට හෝ පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ලෙව්වේගොඩ පුහුණු මධ්‍යස්ථානය සඳහා හාලිඇල ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රදානය කර තිබූ අක්කර 24 රූඩ් 03 පර්චස් 53 ක්වූ ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 13 රූඩ් 03 හා පර්චස් 50 ක පිඹුරුපත අනුව භෞතිකව නොතිබූ අකර, එම ඉඩම් කොටස් මැනීම් සිදුකර ඒවායේ ප්‍රමාණය නිරවුල් කරවාගෙන නොතිබුණි.

(ඉ) 2021 වර්ෂයේ නව නිර්මාණ එළිදැක්වීමක් ලෙස කිණිහිරියා මල නමින් ටෙලි නාට්‍යයක් නිර්මාණය කිරීමට සැලසුම් කර තිබුණද, 2022 දෙසැම්බර් 31 දින වන විටද මෙම නිර්මාණය එළි දක්වා නොතිබුණි. ඒ අනුව, ගෙවන ලද රු. මිලියන 4.8 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. .

(ඊ) එරමිණියාය සෞන්දර්ය හා ගොවිපල පුහුණු මධ්‍යස්ථාන භූමියේ කාය වර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම හා උපකරණ කට්ටල මිලදී ගැනීම වෙනුවෙන් එකතුව රු. මිලියන 1.1 ක් වැයකර තිබුණද එම මධ්‍යස්ථානය නිෂ්කාර්යව පැවතුණි.

(උ) 2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව නිලාවෙලි ගොවිපොළ සඳහා අක්කර 200 ක ප්‍රමාණයක් ලබාදී තිබුණද, එහි පුහුණු පාඨමාලා ආරම්භ නොකර අක්කර 29.5 ක පමණක් පනතේ අරමුණු නොවන ගොවිපොලක් පවත්වාගෙන යාමට කටයුතු කර තිබුණි. වගාවන් සිදු නොකර, ආදායම් නොලබා වසර 03 ක් තුල ආරක්ෂක හා නඩත්තු වියදම් වෙනුවෙන් රු. මිලියන 15.5 ක්ද ඉදිකිරීම් සඳහා රු. මිලියන 22.9 ක්ද, නීත්‍යානුකූලව අයිතිය ලබා ගැනීමේ නෛතික කටයුතු සඳහා රු.652,500 ක්ද වැය කර තිබුණි. එයට අමතරව සත්ව පාලනය සඳහා රු.මිලියන 5.2 ක් වැයකර තිබුණි.

(ඌ) 1990 අංක 01 දරන දේපල පවරා ගැනීමේ පනතේ හදිසි නීති විධිවිධාන යටතේ සභාවට පවරා ඇති බලංගොඩ පොලිස් වසමේ හල්දලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, වල්හපුතැන්න පතන වත්ත නැමැති අක්කර 01 රූඩ් 03 පර්චස් 30 ක ඉඩම හා එහි පිහිටි ගොඩනැගිල්ල 2021 පෙබරවාරි 25 දින රු. මිලියන 7.6 ක් වූ අගයකට තක්සේරු කර තිබුණද, වර්තමානයේ නිෂ්කාර්යව පවතින අතර, ඉඩමෙහි පවතින ගොඩනැගිල්ල නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් විනාශ වීමේ අවදානමකට පත්ව තිබුණි.

(එ) 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනතේ 26 (1) හා (2) වගන්ති අනුව සභාව විසින් ඉටුකරනු ලබන කටයුතු සඳහා පවත්වාගෙන යා යුත්තේ සභාවේම අරමුදලක බව දක්වා තිබුණද, පනතේ කාර්යයන් අනුව කටයුතු කිරීමට ක්‍රීඩා සමාජය හා යෞවන සමාජ පිහිටුවා තිබුණි. රු. මිලියන 20.5 ක්වූ මූල්‍ය වත්කම් පැවති මෙම සමාජවල කටයුතු සඳහා සභාවේ කාර්යය මණ්ඩලය හා භෞතික සම්පත් උපයෝගී කර ගන්නා අතර, මූල්‍ය වාර්තා සභාවේ කළමනාකරණය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) 2022 දෙසැම්බර් 31 දිනට සභාව වෙත පවරා තිබූ නඩු සංඛ්‍යාව 46 ක්වූ අතර, එයින් මූලික අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධ නඩු 24 ක්ද, 2011 වර්ෂයේ සිට 2022 අතර කාලය තුල සභාව විසින් පවරා තිබුණු ඉඩම් නඩු 04 ක්ද විය. මුළු නඩු සංඛ්‍යාවෙන් 09 ක් වසර 05 කට පෙර සිට පැවත එන බව මූල්‍ය වාර්තා මඟින් හෙළිදරව් කර තිබුණි.

(ඔ) ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන ගබඩාවේ පැවති වටිනාකම රු. මිලියන 3.5 ක් වූ අයිතම වර්ග 37 ක් ප්‍රධාන ගබඩාවෙන් විවිධ පුද්ගලයන් හා විවිධ ආයතන වෙත වසර 05 ත් 33ත් අතර කාලයක සිට තාවකාලිකව ලබා දී තිබූ අතර, ඒවා නැවත ප්‍රධාන ගබඩාව වෙත ලබා ගැනීමට, වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඕ) ප්‍රමාණවත් අභ්‍යාසලාභීන් සංඛ්‍යාවක් නොමැති වීම හා උපදේශන දීමනා ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදලක් සභාවෙන් ලබා නොදීම හේතුවෙන් 2022 වර්ෂයේදී දිස්ත්‍රික් 13 ක පැවති පාඨමාලා 24 ක් නතරකර තිබුණි. ඊට අමතරව රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව පාඨමාලාව 2022 දෙසැම්බර් මස 31 දින දක්වා ප්‍රතීතනය කර නොතිබුණි.

(ක) ජපානයේ රැකියා ලබාදීම ඉලක්ක කර ගනිමින් ජපන් භාෂා පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා 2022 වර්ෂයේ රු.මිලියන 3.7 ක අගයකට ලැප්ටොප් පරිගණක 25 ක් මිලදීගෙන තිබුණද, අදාල පාඨමාලාව ආරම්භ කර නොතිබීම හේතුවෙන් එම ලැප්ටොප් පරිගණක ඉහත අරමුණට අදාල නොවන සභාවේ විවිධ අංශ සඳහා නිකුත් කර තිබුණි.

(ග) 2019 වර්ෂයේ සිට දින 13 සිට වසර 1 ½ ක කාලයක් තුල සභාවේ සභාපති / අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 08 දෙනෙකු වරින් වර පත්කර තිබුණි. සභාවේ ප්‍රධාන තනතුරු 02 ක් සඳහා වැඩබැලීමේ හා කොන්ත්‍රාත් පදනමින්ද, නියෝජ්‍ය හා සහකාර තනතුරු 26 ක් හා වෘත්තීය පුහුණු උපදේශක (කොන්ත්‍රාත්) 24 ක් පුරප්පාඩු වී පැවතුණි. අනුමත නොකරන ලද තනතුරු 10 ක් සඳහා නිලධාරීන් 240 ක්ද, 2016 වර්ෂයේ සිට වැඩ බැලීම, වැඩ ආවරණය හා රාජකාරී ඉටු කිරීම සඳහා නිලධාරීන් 121 ක්ද පත් කර තිබුණි. තවද, තරුණ සේවා නිලධාරියෙකු වෙත සහකාර අධ්‍යක්ෂ ඇතුළු තනතුරු 03 ක් ලබා දී තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති